# සැඳෑව

ජ්‍යෙෂ්ඨයන්ගේ අඩහැරය

මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2009 - මාර්තු

වෙබ් අඩවිය : www.sendewa.com විද්‍යුත් ලිපිනය : info@cbpa.com

අංක QD/118/News/2010 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී


සියලුම සාමාජික සාමාජිකාවන් වෙත,

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම **2010 අප්‍රේල් මස 24** වැනි **ශනි දින** පැවැත්වීමට නියමිතය. එබැවින් මෙම මහා සභා රැසවීමේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන යෝජනා ඇත්නම් ඒවා සංගමයේ ගරු ලේකම් වෙත **2010 මාර්තු මස 22** වැනි දිනට ප්‍රථම - **380/10, බෞද්ධාලෝක මාවත, කොළඹ 7** - යන ලිපිනයට එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## ආර්ථිකයේ පසුබැසීමක් තිබේද?

අද පවතින ලෝක ආර්ථික දුෂ්කරතාවයන් තව වසර දෙකක්වත් පවතින බව විද්වතුන්ගේ මතයයි. ප්‍රශ්නය වී ඇත්තේ, කාර්මික උපකරණ, මෝටර් රථ, විදුලි උපකරණ වැනි ප්‍රධාන වෙළඳ භාණ්ඩවලට ඉල්ලීමක් නැති වීමයි. එවිට නිෂ්පාදනය අඩුවී සේවකයින් කර්මාන්ත ශාලාවලින් කොටස් වශයෙන් හෝ ඉවත් කිරීමට සිදුවෙයි.

මෙය ඇත්තටම ආර්ථික පසුබෑමක්ද? නිපදවන්නන් වෙළඳපොල මනින්නේ නැතිව නිපදවයි. හතු පිපෙන්නාක් මෙන් ඉන්දියාවේ හා චීනයේ කර්මාන්ත ශාලා පිහිටුවා ඇත. වාහන ඇත්තන්ට උවමනාවටත් වඩා වාහන තිබේ. ඉන්දියානු රුපියල් ලක්ෂ 1 ½ කට නූතන මාදිලියේ කාරයක් ගතහැක. නවීන කුඩා රූපවාහිණියක් ලක්ෂ 1 ½ වුවත් තාක්ෂණයේ දියුණුවෙන් රු. 25,000/= පමණ L.C.D. රූපවාහිණියක් සාදාගත හැක.

දැන් සාමාන්‍ය ජනයාගේ අවශ්‍යතා සම්පූර්ණ වී ඇති හෙයින් මෙවැනි හයි-ටෙක් භාණ්ඩ විකිණෙන්නේ නැත. බහුතර ජනතාවට ලැබෙන ආදායම ඒදිනෙදා පාවිච්චියට මදි තරම්ය. සෑම නිවසකම ටීවී හා රේඩියෝ ඇත. දුරකථනයේද දැන් රේඩියෝවක් ඇත. ඉතාමත් දුගී වැසියන්ගේ අවශ්‍යතා වෙනස්ය.

අර්ථශාස්ත්‍රඥයන්ගේ මතය නම් මේවා අප රටට බලපාන්නේ නැති බවය. අප රටේ ආර්ථිකය වැටී නැති බවය. එහෙත් අප රටේ කාර්මික නිෂ්පාදන මොනවාද? අප රට බැංකු හා ප්‍රධාන පෙලේ වෙළඳ ආයතන මුදල් රැස්කර ලාබ පෙන්වීම හැර දේශීය වශයෙන් නිපදවීමක් නොකරයි. වැටෙන්නේ උඩ ඉන්න අයයි. අප ඉන්නේ පැදුරේය, එබැවින් අපට වැටෙන්න තැනක් නැත.

ආසියාවේ ආර්ථික බලවතුන් වන ජපානය, චීනය, කොරියාව, ඉන්දියාව, සිංගප්පූරුව හා තායිවානය වැනි රටවල ආර්ථිකයන්හි සුළු පසුබැසීමක් ඇතිවන්නට පුලුවන. මේ රටවල් සියල්ල කරුණාව, අවිහිංසාව, මෛත්‍රිය පෙරදැරි කරගෙන එකම සංස්කෘතියක් පසුබිම්කරගෙන දියුණුවී ඇත. මානව හිමිකම් නොරැකීම හේතුකොටගෙන අප රටට නොයෙක් ජී.එස්.පී. වැනි ආධාර නොලැබෙන්නට ඉඩ ඇති බව මේ ගැන දන්නා උගතුන් නිසි අවවාද දී ඇත. ඉන්දියාව හා ජර්මනිය වැනි රටවල මානව හිමිකම් හා අහිංසක සත්ව හිමිකම් සුරක්ෂිත නීතිද සමාන තත්ත්වයක පවතී. එම රටවල හිංසාවට තැනක් නැත. ඇතින්නගේ කිරි බොන අලි පැටවුන් ඇදගෙන යෑමද හිංසාවකි. අප සංස්කෘතියට කැලලකි. අපට ඕනෑ දෙයක් කළ හැකිය යන ස්ථාවරය තබාගෙන ලෝකයේ තනිව ජීවත්වීමට නොහැක. රජය හා ආගමික නායකයින් ආදර්ශයක් දැක්විය යුතුය. අපගේ උරුමය වන හින්දු හා බොදු චින්තනයට ගරුකිරීමක්ද නැත. අප සංස්කෘතිය මෙම ආර්ථික ලැව් ගින්නට එකම සිසිල වේ.

ටී. වික්‍රමසිංහ

## අපගේ වටිනා මානව සම්පත රැකගනිමු.

දුර්ලභංච මනුස්සත්තං - බුදුන් වහන්සේගේ වදනින් පවසතොත් මිනිසත් බව ලබාගැනීම අතිශයින් දුර්ලභ දෙයකි. එය මනාකොට රැකගැනීම ඊටත් වඩා අසීරු දෙයකි. මිනිස් උපතේ පටන් මරණය දක්වා අප කවුරුත් දන්නා පරිදි මෙලොව ඇති භෞතික සම්පත්වලින් ප්‍රයෝජන ගන්නා මිනිසා මිනිසත් බව කෙලෙසා නොගෙන ජීවිතය යථාපරිදි ගතකිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටළු ප්‍රශ්න ගැන සලකා බැලීමේදී මෙලෙස නියම ලෙස භෞතික සම්පත් ප්‍රයෝජනයට ගන්නා පිරිසගේ සීමිතකමක් දක්නට ලැබේ.

මෙලොව ස්වභාවධර්මයෙන් මිනිසාට ලබාදී ඇති දායාද අතර මුදල්මය දායාදය අද ප්‍රධාන තැනක් ගනී. මෙම දායාදය නොනිසි අන්දමින් ප්‍රයෝජන ගැනීමට උත්සාහ දරන මිනිසා නොදැනුවත්වම මිනිසත් බව කෙලෙසා ගනී. බුදුන්ගේ ධර්මයට පටහැනිව තණ්හාව ආශාව මැඩ නොගෙන කටයුතු කිරීම නිසා බොහෝ මිනිසුන් අගාධයට වැටී සිටී. අනෙක් අතින් ලෙඩදුක් කරදරවලට ගොදුරු වී සිටී.

මෙලොව උපත ලද අප කෙදිනක හෝ මරණයට ගොදුරුවන අතර හිස් අතින්ම මෙලොවින් සමුගැනීමට සිදුවීම ස්වභාවික ක්‍රියාදාමයකි. මෙම කාලය තුළ අප විසින් පරිහරණය කරන භෞතික සම්පත් මෙන්ම අප නිරන්තරයෙන් මෙලොව බිහිකරන මානව සම්පත කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයි. මෙලොව පවත්වා ගෙන යන මතු පරපුරට ආදර්ශයක් දෙමින් අප කටයුතු කළයුතු අතර මානව සම්පත සුරැකීමට ඉවහල්වන මුදල්මය ඇතුළු භෞතික සම්පත් ලබාගැනීමටත් ඒවා නිසි අයුරින් පරිහරණය කිරීමටත් අප විසින් උත්සුක විය යුතුයි. බුදුන් වහන්සේද ගිහියෙකුගේ ආදායම කොටස් 4 කට බෙදා වියදම් කළයුතු බව දේශනා කොට ඇති බව ඔබ කවුරුත් දන්නා කරුණකි.

මෙයින් පිළිබිඹු වන්නේ අනාගත සුරක්ෂිතතාව උදෙසා යම් යම් කැපකිරීම් සිදුකිරීමට මිනිසාට සිදුවන අතර අතීතය සහ වර්තමානය තුළින් ලබන අත්දැකීම්වලින් පරිපූර්ණ වන මිනිසා ආගම දහමට අනුව කටයුතු කරන්නේ නම් අනාගතයේ මානව සම්පත රැකගැනීම එතරම් ගැටළුවක් නොවනු ඇත.

**චාලට් දසනායක (විශ්‍රාමික) 3129**

## භාවනාව හා බුදු දහම

"අප රටේ වෙනදාට වඩා ධර්මය ගැනත් භාවනාව ගැනත් බොහෝ දෙනා තුළ විශාල උනන්දුවක් ඇති වී තිබේ.

මේ නිසාම ලංකාව පුරා විවිධ මධ්‍යස්ථාන තුළින් විවිධ භාවනා ක්‍රමයන් එළි දක්මින් තිබේ. බොහෝ දෙනා ආතතිය, ලෙඩ රෝග, අපල උපද්‍රව, මානසික නිදහස යන විවිධ හේතු කරණකොටගෙන මේවා පසුපස යයි. බුදුරජාණන් වහන්සේ වදාළ බෞද්ධ භාවනා ක්‍රම මේ අතර විශේෂයි.

ඉහත කී ලෙසින් භාවනා ආරම්භයට උදව්වන්නා වූ නිවැරදි ක්‍රමවේදයන් යම් තරමකටවත් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍යය. මේ සඳහා ආගම් භේදයක් නොමැත. ජේසුස් වහන්සේ ඉගැන්වූ ධර්මයට ද මෙයින් අසාධාරණයක් නොවනු ඇත.

එබැවින් මේ සම්බන්ධව අප රටේ භාවනා පිළිබඳ වියත් උතුමාණන්ගෙන් ගුරුහරුකම් ලැබ සිටින ගිහි පින්වතකු විසින් ඉරිදා දිනයන්හි භාවනාව පිළිබඳ මූලික උපදේශන පවත්වනු ලබයි.

මෙම දේශනයන්ට සහභාගිවීමට කෙරෙන විවෘත ආරාධනයයි.

රෙක්ස් ප්‍රනාන්දු

(අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා අප සාමාජික රෙක්ස් ප්‍රනාන්දු මහතාගේ 011-2234073 දුරකථනයට ඇමතුමක් දෙන්න.)

## සහන මිලට චාරිකා සේවාවක් සහ නිවාඩු නිකේතන පහසුකම්

මහ බැංකු ස්වේච්ඡා විශ්‍රාමිකයන්ගේ සීමා සහිත ඉසුරු මැනේජ්මන්ට් සර්විසස් මගින් වායු සමනය සහිත හෝ රහිත බස් රථ මහ බැංකු විශ්‍රාමිකයිනට චාරිකා සඳහා සහන මිලකට සැපයීමට සූදනම් බව එම ආයතනය අප වෙත දන්වා ඇත. ඔවුන් සතු කතරගම සහ අනුරාධපුර නිවාඩු නිකේතනවල සතියේ මුල් දින වලදී නවාතැන් ගන්නේ නම් විශේෂ වට්ටම් ලබා ගැනීමටද පුලුවන.

විමසීම් :

දයාරත්න - 047-2235186
වීරසිංහ - 033-2260233
ලක්ෂ්මන් - 011-2242905
වසන්ත - 033-2226595

## සමාවන්න..!

මෙවර "සැඳෑව" දෙමළ භාෂාවෙන් පළවන්නේ නැත. සාමාන්‍යයෙන් ද්‍රවිඩ භාෂාවෙන් ලියූ නිර්මාණ ලැබෙන්නේ කලාතුරකිනි. මෙවර කලාපය ඉක්මනින් සංස්කරණය කිරීමට සිදුවූ නිසා ද්‍රවිඩ භාෂාවෙන් ලියවුන නිර්මාණ සොයාගත නොහැකි විය. නමුත් ලබන කලාපයේ සිට දෙමළ භාෂාවෙන් සුපුරුදු ලෙස "සැඳෑව" නිකුත්වනු ඇත.

*(සුන්දර අතීතයෙන් .......!)*

# "වරදක් කළත් - සිතකින් නොවේ ....... !"

රෑ පැවැති සාදයෙන් පසු අවන්හලින් එළියට ආ සිය මිතුරා මධුවිතෙන් පදමට මත්වී සිටි බැවින්, ඔහු ඔහුගේ නිවසට ඇරැලීමට තීරණය කරගත් මිතුරන් දෙදෙනෙක් ඔහු වත්තම් කරගෙන තම කාරයට නංවා ගනු ලැබූ අතර, තමන් යා යුතු තැන හරිහැටි දැන නොසිටි නිසා ඔහුගේ මඟ පෙන්වීම අනුවම ගමන යාමට පිටත් වූහ. පසුපස අසුනේ නිදි වැටෙමින් සිටි මිතුරා වරින් වර පිටත බලමින් මඟ සළකුණු කීවේ මහත් ආයාසයෙනි.

මධුවිතෙහි මත කෙතෙක් වැඩි වුවත්, මිතුරාගේ දැඩි ඉල්ලීම වූයේ බිරිඳට නොදැනෙන ලෙස සිය නිවසට මඳක් ඈතින් පෙනෙන මානයේ තැනක තමා බස්සවා වහා නොපෙනී යන ලෙසය. බිරිඳ දුටුවහොත් මිතුරන් දෙදෙනාටද ඈ දෝෂාරෝපනය කරනු නොඅනුමාන බවද ඔහු වැඩි දුරටත් කීය.

ඒ අනුව නිවාස කීපයකින් යුත් පෙදෙසකදී ඔහු බස්සවා ඉවත්ව ගිය මිතුරන් දෙදෙනාට පසුදු උදැසන අසන්නට ලැබුණේ කණගාටුදයක ආරංචියකි. සිද්ධියකි. එනම් පෙරදින රාත්‍රියේ තමන් නිවසට ඇරැලවූ මිතුරා පහර කෑමකට ලක්ව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බවය.

මේ පුවත ඇසීමෙන් කම්පාවට පත් කාර්යාලයේ හිතවතුන් කීපදෙනෙකු ඒ සැණින් රෝහල වෙත ගිය අතර, ඉහත කී උපකාරය කළ සගයන් දෙදෙනාද ඒ අතර වූහ.

"මචං....! අපි ගේ ලඟින්ම බස්සවල ආවට පස්සෙත් මෙහෙම දෙයක් සිද්ද වුනේ කොහොමද?"

බෙහෙවින් විමතියට පත් ඔවුහු විමසා සිටියහ.

"මේකනේ.... ඔය ගොල්ලෝ මං බස්සවල ගියාට පස්සේ අමාරුවෙන් මං ගේ ඇතුළට කෙලින්ම ගිහින් කළුවරේම වයිෆ් නිද හිටිය ඇඳේ පැත්තක ඇලවුණා විතරයි යාන්තන් මතක"

"ඉතින් වයිෆ් මේ තරං දුෂ්ඨ කෙනෙක්ද?"

මිතුරාගේ මුහුණ, පපු පෙදෙස හා අතපය ආදියේ දමා තිබෙන වෙළුම්පටි කන්දරාව දෙස විමසිල්ලෙන් බලමින් සියල්ලෝම ඇසූහ.

"නෑ..., නෑ... මේ එයා කරපු දෙයක් නෙවෙයි"

මෙසේ කියා ඔහු වටපිට බලන්නට වූයේ සිය බිරිඳ ඒ අසලක සිටීදැයි විමසන්නාක් මෙනි. ඈ පෙනෙන්නට නොසිටි බැවින් සිද්ධියට හේතුවූ කරුණ මිතුරා පැහැදිලි කළේ ඉන්පසුවය.

"මචං.... මං ගිහින් තියෙන්නේ අල්ලපු ගෙදරට නේ...."

ඒ ඇසූ සියල්ලෝම, නැගී එන සිනාව මැඩ ගනිමින් එකිනෙකා දෙස විශ්මයෙන් බලන්නට පටන් ගත්හ.

~~~~~~~

*- ගාමිණී චන්ද්‍රසේන --*

(කාර්යාලයේ මිතුරෙකු මුහුණ පෑ සත්‍ය සිද්ධියක් පාදක කොටගෙන ඒ සුන්දර අතීතය ස්මරණය කිරීමේ අරමුණෙන් කළ නිර්මාණයකි.)
~~~~~~~

# ඉතිං ආයුබෝවන් හිතවතුනි ගරූ ...!

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ නායකත්වය අමතා මා විසින් එවනු ලබන මෙම ලිපිය ඔබ අතට පත්වන විට මම ශ්‍රී ලංකාව හැර දමා වෙනත් රටක පදිංචියට ගොස් හමාරය. එය ඉතා අකැමත්තෙන් ගත් තීරණයකි. එම තීරණය ගැනීමට හේතු වූයේ ඇයි දැයි ලිපිය අවසානයේ දී ඉදිරිපත් කරන්නෙමි.

මම මේ ලිපියේ මාතෘකාවට යොදා ගත් "ඉතින් ආයුබෝවන් හිතවතුනි ගරූ..." යන වැකිය මගේ නිර්මාණයක් නොව ඔබ සංගමයේ 2009 අප්‍රියෙල් "සැඳෑව" කලාපයේ හිටපු විධායක කමිටුව සමු ගැනීම සඳහා කළ ලියැවිල්ලෙන් උපුටා ගැනුණකි. විධායක කමිටුව එදා සමු ගැනීමට බලාපොරොත්තු වුවද සාමාජිකත්වයේ බල කිරීම මත තව වසරක් රැඳෙන්නට සිදුවිය. එය දෛවයේ සරදමක්දැයි මම නොදනිමි.

2009 අගෝස්තු "සැඳෑව" කලාපයේ මුල් පිටුවේම සංගමයේ සභාපතිවරයා මහත් අභිමානයෙන් කියා සිටියේ "මට තිර ලෙස විශ්වාසයි" යන්නය. සභාපතිවරයා එහි මෙසේ සඳහන්කර තිබුණි. ඒ වගේම "මට තිර ලෙස විශ්වාසයක් තියෙනවා අධිපතිතුමා අපගේ ලිඛිත ඉල්ලීමට සාධාරණයක් ඉටුකිරීම සඳහා තම අවධානය යොමු කරාවි කියලා"

නමුත් සියල්ල සිදු වී ඇත්තේ විශ්‍රාමික සංගමය කිසිසේත්ම බලාපොරොත්තු වූ ආකාරයට නොවේ. 2006 වසරේ දී ලබාදුන් 5% ක විශ්‍රාම වැටුප් වැඩිකිරීම පූර්වාදර්ශයක් කරගත්තාක් මෙන්ම 2009 වසරේදීද 5% ක වර්ධන සීමාවකට විශ්‍රාමිකයා හිරකර ඇත. මේ අනුව විශ්‍රාමිකයින්ගේ වාර්ෂික විශ්‍රාම වැටුප් වැඩිවීම පසුගිය අවුරුදු 06 තිස්සේම වාර්ෂිකව වැඩි වී ඇත්තේ 2% කටත් අඩු ප්‍රතිශතයකිනි. 2006 සහ 2009 වසරවලදී වර්තමාන අධිපතිවරයා යටතේ මහ බැංකු සේවකයන්ගේ වැටුප දෙගුණයකට ආසන්නයෙන් වර්ධනය විය. නමුත් විශ්‍රාමිකයාට සෑහීමකට පත්විය හැකි වැඩිවීමක් එම අවස්ථා දෙකෙහිදීම ලැබුණේ නැත.

විශ්‍රාමිකයන්ගේ, විශේෂයෙන්ම පැරණි විශ්‍රාමිකයන්ගේ අඩු මට්ටමේ විශ්‍රාම වැටුප ගැන ඔබ සංගමය පාලන අධිකාරියට හොඳින් කරුණු ඉදිරිපත් කරන්නට ඇති බවක් සංගමයේ ප්‍රකාශනවලින් මට පෙනී යයි. එසේ වී තිබියදීත් ඔවුනට සාධාරණයක් ඉටු නොවීම ගැන සංගමයේ නායකයින් බෙහෙවින් කළකිරීමට පත්ව ඇතැයි මම අනුමාන කරමි. 2009 අගෝස්තු මාසයෙන් පසුව තවමත් "සැඳෑව" නිකුත් වූයේ නැත. සාමාජිකත්වයට කුමක් කිය යුතු දැයි තීරණය කර ගැනීමට බැරිව අන්දමන්දව සිටීම මෙයට හේතුව ලෙස මම දකිමි.

කෙසේ වෙතත් සංගමයේ වර්තමාන නායකත්වය සාමාජිකයන් අතර හොඳ සංවාදයක් මෙන්ම නව ප්‍රබෝධයක් ඇති කිරීමටත් "සැඳෑව" යොදා ගත් බව මම පිළිගනිමි. විශ්‍රාමිකයිනට මෙසේ ඇමතීම වැදගත් බව මේ නිසා අප් අයටද පෙනී ගියේය. "මහසෝනා" නම් අන්වර්ථ නාමයකින් . මහ බැංකුවේ ක්‍රියා කලාපය දැඩි ලෙස විවේචනය කළ පුද්ගලයෙකුගේ ලියුම් මට පසුගිය කාලය පුරාම ලැබුනි. තවත් අයටද මෙම ලිපි ලැබී ඇති බව මගේ විශ්වාසයයි. මෙම ලිපිවල තිබෙන සමහර කරුණු ගැන සැලකිල්ලක් දැක්විය හැකි වුවද එහි භාෂා විලාශය ඉතාමත් පහත් මට්ටමක තිබුනි. කෙසේ වෙතත් මම මේ ලිපි සියල්ල කියවීමි. "මහසෝනා" ගේ ලිපි සීමිත පිරිසක් අතර සංසරණය වන බැවින් ඔහු කවුදැයි මට හැඟී යන ලෙස හඳුන්වා දීම පළමුව කළ යුත්තකි. ඔහු දැඩි එක්සත් ජාතික පාක්ෂිකයෙකි. එසේම වර්තමාන විධායක කමිටුව කෙරෙහි ඇත්තේද දැඩි අප්‍රසාදයකි. මහ බැංකු නායකත්වය දරුණු ලෙස විවේචනය කරයි. ඔහුගේ ඉංග්‍රීසි භාෂාව හැසිරවීම උසස් මට්ටමක තිබුනද සිංහලය හැසිරවීමේදී වඩාත්ම පාවිච්චියට ගෙන ඇත්තේ පහත් මට්ටමේ අශ්ලීල වදන්ය. පසුගිය ජනාධිපතිවරණයේ දී සරත් ෆොන්සේකා මහතාගේ ජයග්‍රහණය උදෙසා වෙහෙස මහන්සි වූවෙකි. නොබෝද, සරත් ෆොන්සේකා මහතා විශ්‍රාමිකයන් අමතා එවූ ලිපියත් එයට පිළිතුරු වශයෙන් මහ බැංකු වෘත්තිකයන්ගේ සන්ධාන සහයෝගිතා සංගමය එවූ ලිපියත් මා සතුව ඇත. මේ ලිපි සියල්ල විවේකීව කියවන විට මට හැඟී ගියේ අනාගතයේ දී මහ බැංකු විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නය දේශපාලන කරළියේ දී රැව්දිය හැකි බවයි.

සරත් ෆොන්සේකා මහතා විශ්‍රාමිකයන් වෙත එවූ ලිපිය ගැන ඉක්මන් ප්‍රතිචාරයක් දක්වන මහ බැංකුවේ සන්ධාන සහයෝගිතා සංගමය තම ලියවිල්ලේ මෙසේ සඳහන් කරයි.

"සරත් ෆොන්සේකා මහතාගේ අත්සනින් යුතුව මහ බැංකුවේ දැනට සේවය කරන කෙලෙහි ගුණ නොදන්නා අකෘතඥ පිරිසක් විසින් ලියා ඔබ වෙත එවන ලද පත්‍රිකාව සම්බන්ධයෙනි."

මෙම ප්‍රකාශනය අනුව මෙම ලියවිල්ල විශ්‍රාමිකයන් විසින් සැපයූ ලියවිල්ලක් නොව මහ බැංකුවේ සිටින අකෘතඥ පිරිසකගේ ක්‍රියාවක් බව හෙළි කර තිබුණි. එක්සත් ජාතික පක්ෂ යුගයේ දී මහ බැංකුව තුළ සිදුවූ අක්‍රමිකතා සිහිපත් කරගන්නැයි එම

ලිපියෙන් විශ්‍රාමිකයන්ට ආරාධනා කර තිබුණි. එසේම වර්තමාන අධිපතිතුමා මහ බැංකු සේවකයින්ට ලබාදී ඇති වරප්‍රසාද හා සැලකිලිවලට කෘතවේදී විය යුතු බව මතක් කරදෙයි. මෙම කාරණයේ දී වර්තමාන අධිපතිවරයා ආයතනයට කර ඇති සේවාව ඔබ සංගමයේද ප්‍රකාශනයක තිබූ බව මගේ මතකයට නැගේ.

"නමුත් අද සියල්ල වෙනස් වෙමින් පවතී. අඩු වයසෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතිරේක ප්‍රධානීන් හා නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස උසස්වීම් ලබන අයගේ තොරතුරු සඳහන් කවුළුවේ පින්තූර පිටුවේ අතරින් පතර හෝ තාරුණ්‍යය හිනැහෙන්නට මහගෙදර තුළින් අරුණළු උදාවී ඇද්දෝයි සිතේ......... ඕනෑම ආයතනයක සේවක ප්‍රබෝධයක් තිබේ නම්, එය වෘත්තීය සමිති නොවන සමිති සමාගම් මගින් ප්‍රදර්ශනය කෙරේ. එවා සක්‍රිය වන්නේ නම්, රජ සැලකිල්ල ලබන්නේ නම් සියල්ල යහපත් වී කාර්මික සහජීවනය එල දරා සේවක කාර්යක්ෂමතාව මෝදු වේ....... අපේ මහ ගෙදර, එනම් ශ්‍රී ලංකා මහ බැංකුව තුළින් තාරුණ්‍යය හිනැහෙන බව අපි දුටිමු." (සැඳෑව - 2008 අගෝස්තු)

මෙම යහපත් ප්‍රවනතාවයට සම්බන්ධ කරගත හැකි තවත් ප්‍රකාශනයක් මගේ මතකයට නැගේ. මෙම ප්‍රකාශනය සැඳෑව වෙත එවා තිබුනේ මහ බැංකුවේ හිටපු අධිපති වරයෙකු වූ අමරානන්ද ජයවර්ධන මහතායි.

"යහපත් ආයතනයන් හැමවිටම විශ්‍රාම වැටුප් සංශෝධනය වෙන් වශයෙන් නොව වැටුප් සංශෝධනය සමගම සිදුකරනු ලබයි."

(සැඳෑව - 2009 පෙබරවාරි)

මින් අදහස් කරනු ලබන්නේ වැටුප් වැඩි කිරීම සහ විශ්‍රාම වැටුප් වැඩි කිරීම වෙන් වෙන් වශයෙන් නොව දැරීමට සිදුවන බර පැන එකටම තීරණය කිරීම සුදුසු බව නිර්දේශ කිරීමක් විය හැකිය. මෙහිදී පිරිසකට උපරිම වශයෙන්ද තවත් පිරිසකට අවම වශයෙන්ද සැලකීමට ඇති ඉඩකඩ ඇතිරෙනු ඇත. අමරානන්ද ජයවර්ධන මහතාගේ මෙම ප්‍රකාශනයත් ඔහුගේ භාවිතයත් පිළිබඳව කෙනෙකුට ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. නමුත් එම ප්‍රකාශයේ හරය පිළිබඳව මහ බැංකුව වැනි උත්තරීතර ආයතනයකට ඇති ගැලපීම සිහියට ගත යුතුව ඇත.

මෙම කාරණයටම අදාලව සරත් ෆොන්සේකා මහතා විශ්‍රාමිකයන්ට කළ ආයාචනයේ සඳහන් වැකියක් වෙනත් මානයකින් ග්‍රහණය කර ගතහැකිය.

"මහත් පරිශ්‍රමයකින් හා කරුණු දැක්වීම් වලින් පසු වසර තුනකට වරක් ලැබෙන විශ්‍රාම වැටුප් වැඩි කිරීම් සති දෙකක කාලයක් යහපත් ජීවන තත්ත්වයක් පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවේ. වඩාත් සරදම වන්නේ අපගේ සංස්කෘතිය අනුව බාලයින් තම ජ්‍යෙෂ්ඨයින් රැක බලාගැනීම වුවත් මහ බැංකුවේ වර්තමාන නායකත්වය එය නොසලකා හැරීමයි."

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නයට අදාලව "මහසෝනා" එවා ඇති ලිපිවල සමහර වාක්‍ය නැවතත් මගේ සිහියට නැගේ. ඔහුගේ ලිපිවල උපුටා ගැනීම් ඉදිරිපත් කිරීමේදී සමහර අශ්ලීල යෙදුම් ඉවත් කරන්ට මට සිදුවී ඇත. ඒත් සමහර ඒවා ඔහුගේ ස්වරය තේරුම් ගැනීම සඳහා තිබෙන්නට හැරීම වඩාත් සුදුසුයයි වරෙක සිතේ.

".......කාර්ය මණ්ඩලයේ වැටුප් 70% සිට 100 දක්වා ඉවක් බවක් නැතුව වැඩි කළේ මහ බැංකුව අද තිබෙන තත්ත්වයට ගෙනඒමට උරදුන් වයෝවෘද්ධ විශ්‍රාමිකයින් තුට්ටු දෙකකටවත් නොතකාය. මෙවර 40% දක්වා වැටුප් වැඩි කළේ රටේ ආර්ථිකය වෙනත් අංශවල සේවක වැටුප් ප්‍රශ්න හෝ මහ බැංකු විශ්‍රාමිකයින්ගේ ප්‍රශ්නද මායිම් කිරීමක් නොමැතිවය. සමහර ශ්‍රේණිවලට 60% ක් දක්වාත් සමහර ශ්‍රේණිවලට 100% කින්ද වැටුප් වැඩි කර ඇත. මේ නිසා 2009 ජනවාරියේ දී කළ යුතු වැටුප් වැඩි කිරීම පාරාවළල්ලක් වී ඇත."

සන්ධාන සහයෝගිතා සංගමයේ ප්‍රකාශනයත් හිටපු අධිපති අමරානන්ද ජයවර්ධන මහතාගේ ප්‍රකාශනයත් මහසෝනා ගේ උද්වේගකාරී හැඟීම් වල ඇති දේත් යම් ආකාරයක ගැලපීමක් සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රකාශනයට හේතු පාදක වී ඇත්දැයි කෙනෙකුට සොයා බැලිය හැකිය. ඉදිරියේ දී මහ බැංකු නායකත්වය මෙවැනි චෝදනාවලින් ආයතනයේ කීර්තිනාමයට වන හානිය පිළිබඳව ගැඹුරින් සිතා බැලිය යුතුව ඇත. මහ බැංකුව යම් යම් විශේෂ වරප්‍රසාද ලැබීම්වලට සුදුසුය යන පොදු මහජන මතය රැකගැනීමට නම් එහි උත්තරීතරභාවය රැක ගත යුතුමය.

ගස්වැල් වලට පොහොර දමනවිට කපා ඉවත් කිරීමට ආසන්න ඒවාට වැඩි සැලකිල්ලක් නොදක්වීම සාමාන්‍ය සම්ප්‍රදායයි. මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමයටත් මෙම සාධකය බලපා ඇත්දැයි මට වරෙක සිතේ. එයට මට ඉඟියක් ලැබුණේද "සැඳෑව" ප්‍රකාශනයකිනි.

"මහ බැංකුව ආරම්භ කරන අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් ක්‍රමයක් නොතිබූ බව සැබෑය. නමුත් අර්ථ සාධක අරමුදලක් සහ විශ්‍රාම වැටුප් අරමුදලක් තිබුණි. පසු කලෙක විශ්‍රාම වැටුප්

අරමුදල සමඟ මාසික විශ්‍රාම වැටුප් ක්‍රමය හුවමාරු කරගන්නා ලදී. නමුත් මෙය මහ බැංකු සේවකයාට කවුරුන් හෝ රිදී බන්දේසියක බහා කළ පිළිගැන්වීමක් නොවේ. මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය එකල නායකත්වය දැරූ දූරදර්ශී වෘත්තීය සමිති නායකයින් හා මහ බැංකුව සුවිශේෂ ආයතනයක් බව හොඳින්ම තේරුම්ගත් පාලන අධිකාරිය විසින් සාමූහිකව දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. විශ්‍රාම වැටුප් ක්‍රමයක් කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන යාම තුළින් රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ තිබූ සාධනීය අංග එකතුකරගෙන මහ බැංකුවටම සුවිශේෂී වූ විශ්‍රාම වැටුප් ක්‍රමයක් දායාද කිරීමට එකල පාලන අධිකාරියට හැකියාවක් හා දක්ෂතාවක් තිබුනි. එසේම මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය අනාගතයේ දී සේවයට පැමිණෙන සේවකයාගේ ද වරප්‍රසාදයක් සේ රැක ගැනීමට එකල සිටි වෘත්තීය සමිති නායකයෝ වග බලා ගත්හ.

නමුත් 1997 සිට විශ්‍රාම වැටුප් ක්‍රමයට කණකොකා අඬන්නට විය. මහ බැංකුව ආමන්ත්‍රණය නොකළ ලිපියක පිටපතක් මත පිහිටා මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය ඒක පාර්ශ්විකව නවතා දමන ලදී. රජයේ සේවකයාටද මෙම හැන්දෙන්ම බෙදන ලදී. නමුත් වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත රජයේ සේවකයින්ට නැවත විශ්‍රාම වැටුප් ක්‍රමය ස්ථාපිත කෙරිණි. මෙහිදී මතක තබාගත යුතු වැදගත්ම කරුණ වන්නේ එය පැවැති ක්‍රමය කපාකොටා අලුතෙන් සකස් කරන ලද්දක් නොව පැරැණි ක්‍රමයම ස්ථාපිත කිරීමක් වීමය. රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත ලබා දුන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බැංකු සේවකයින්ට ද එය ලබාදෙන බව නොබෝදා ප්‍රකාශ කරන ලදී. මේ මොහොත වනවිට මහ බැංකු විශ්‍රාමිකයින් 1200 ක් වූහ. විශ්‍රාම වැටුප් හිමි සේවකයෝ 1000 ක් පමණ වූහ. විශ්‍රාම වැටුප් අහිමි කරන ලද තරුණ තරුණියෝ 500 ක් පමණ වූහ. මෙම කරුණ තවදුරටත් පැවතිය හොත් තව අවුරුදු 15 ක් පමණ වන විට විශ්‍රාම වැටුප් අයිතිය දිනාගත් බොහෝ විශ්‍රාමිකයින් මියගොස් විශ්‍රාම වැටුප් හිමිකම් තියන කොටස මෙන් දෙතුන් ගුණයක පිරිසක් එය අහිමි කරනු ලබන කොටසෙහි මහ බැංකුවේ සක්‍රිය සේවාවේ යෙදෙනු ඇත. තමන් ගේ විශ්‍රාම වැටුප් වරප්‍රසාදය අහිමි කරන විට මුනිවත රැක පීට පිළියමක් නොදී සිටි පිරිසකට තමන්ට නැති වරප්‍රසාදයක් ගෙඩි පිටින් ලැබෙන විට ඔවුන් ඒ දෙස කවර දෘෂ්ඨි කෝණයකින් බලත්දැයි එදට විශ්‍රාමිකයින් වන දැන් සිටින "සිරා පොරවල්" සිතා බැලිය යුතුව ඇත. එම නිසා දැන් තරුණ තරුණියන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය රැකදීම තමන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය රැකගැනීමක් ලෙස නිර්වචනය කරගත යුතුව ඇති කාලය දැන් එළඹ ඇත."

(සැඳෑව - 2009 පෙබරවාරි)

මා දන්නා තරමට මහ බැංකුවේ නවක සේවකයන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමය තවමත් සාකච්ඡාවලට සීමාවී ඇත. ගරු ජනාධිපති තුමා එක් වරක් නොව දෙවරක්ම බැංකු සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය ලබාදෙන බවට ප්‍රතිඥා දී ඇත. ඒ නිසා මෙම කල් මැරීම එතරම් සුභදායක නොවේ. විශ්‍රාම වැටුපක හිමිකම ගැන හොඳින් දන්නා වයෝවෘද්ධ විශ්‍රාමිකයින් වශයෙන් ඔබ සංගමය වගකිවයුත්තන්ට කරුණු පහදා දීම තුළින් තම යුතුකම ඉටුකර ඇත. තම නායකයින් ප්‍රශ්නය විසඳනු වෙනුවට මැතිවරණ ආසන්නයේ දී ඔවුනට ලකුණු දාගැනීම සඳහා වරින් වර මෙම ප්‍රශ්නය ඉස්මතු කරන බව ඇතැම් නවක සේවකයෝ පවසති. මෙය ඉක්මනින් විසඳුවේ නැත්නම් මී ළඟ මැතිවරණයක දී යම් අපේක්ෂකයෙකුට මහ බැංකු විශ්‍රාමිකයින් පමණක් නොව මහ බැංකුවේ නවක සේවකයන් ද අමතා මෙසේ ලිවිය හැකිය.

"වඩාත්ම සරදම වන්නේ අපේ සංස්කෘතිය අනුව බාලයන් සහ ජ්‍යෙෂ්ඨයින් රැක බලා ගැනීම මගහැරිය නොහැකි වගකීමක් වුවත් මහ බැංකුවේ වර්තමාන නායකත්වය එය නොසලකා හැරීමයි."

මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමයේ කඩා වැටීමක් පිළිබඳව ද දක්වා ඇති ඉඟිය මෙම කාරණයේ දී අවසාන වශයෙන් උපුටා දැක්වීම සුදුසු යැයි මට සිතේ.

"විශ්‍රාම වැටුප් ක්‍රමයක පැවැත්ම තහවුරු වීමට අවශ්‍ය පළමු කොන්දේසිය වන්නේ අතීතයේත් වර්තමානයේත් මෙන්ම අනාගතයේදීත් සෑම සියලු දෙනාටම එය විවෘතව තිබීමය. දෙවැන්න විශාල වැටුප් පරතරයක් නොවන ආකාරයට එය විටින්විට යාවත්කාලීන කිරීමය. තුන්වැන්න අරමුදල නඩත්තු කිරීම සඳහා ඒ ඒ අවස්ථාවලදී අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමය........ එහි පැවැත්ම විනාශ කිරීමට යමෙකුට අවශ්‍ය නම් කළ යුතුව ඇත්තේ මෙම කාලත්‍රය අතර ගැටීම් නිර්මාණය කර ස්වාභාවික මරණයක් සිදුවීමට සැලැස්වීමය. අතීතයට සොච්චමක් දිගුකොට වර්තමානයට සාධාරණය ඉටුකර අනාගතයට කිසිවක් නොදීම තුළ මෙම ගැටුම ඉබේම නිර්මාණය වේ. කාලයාගේ ඇවෑමෙන් සක්‍රිය වර්තමානය අක්‍රිය අතීතයට පත්ව අනාගතය සක්‍රිය වර්තමානය බවට පත්වූ විට අනුන්ට කැපූ වලේ තමන් ද වැටෙනු ඇත. එවිට සියල්ල සිදුවී හමාරය. අතීතයේ නියෝජනය කරන වයෝවෘද්ධයන් ගේ හඬට කන් නොදීම තුළ වඩාත් විපත් උරුමකරගන්නේ වයෝවෘද්ධයන් නොව අනාගතයේ දී වයෝවෘද්ධයන් වන වර්තමානයේ තරුණ කොටස්ය."

(සැදෑව - 2009 පෙබරවාරි)

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ ප්‍රශ්නයේ තවත් ඉසව්වකට ඔබේ අවධානය යොමුවී තිබීම වැදගත් කරුණකි. රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දී විශ්‍රාම වැටුප් තලවල විශාල පරතරයක් නිර්මාණයවීමට ඉඩදෙනු නොලැබේ. සේවක වැටුප් වැඩිවන සෑම අවස්ථාවකදීම විශ්‍රාමිකයින්ගේ දීමනා වැඩි කිරීමත් විටින් විට විශ්‍රාමිකයින්ගේ වැටුප් තල යාවත්කාලීන කිරීමත් තුලින් මෙම පරතරය අඩුකරනු ලබයි. නමුත් මහ බැංකුවේ මෙවැනි ක්‍රමයක් තවමත් ක්‍රියාත්මක වී නොමැත. මෙම තත්වය ඔබ සංගමය මනාව හඳුනාගෙන තිබුණි.

"රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් තිබුන ද මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් නොමැත. මහ බැංකු සේවයට බැඳී විශ්‍රාම ගිය සේවකයින් මතුවන්නේ 1980 මුල්භාගයේ සිටය. එම නිසා මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය තුළ සකස් කළයුතු අඩු පාඩු රාශියක් තිබේ. රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් කීප අවස්ථාවකදී වැඩි කරන විට විශ්‍රාමිකයාට ද සාධාරණයක් කරනු සඳහා විටින් විට ඔවුන්ගේ වැටුප් තල යාවත්කාලීන කෙරින. මේ අනුව 1996 වසරේදී සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ගත් දිනය 1996 දක්වා යාවත් කාලීන කර විශ්‍රාම වැටුප ගණනය කරන ලදී. මහ බැංකුවේ විශ්‍රාම වැටුප් ක්‍රමය බිහිවී වසර 30 කට ආසන්න කාලයක් ගත වුවද එවැනි යාවත්කාලීන කිරීමක් මෙතෙක් සිදුවී නොමැත. මහ බැංකුව තුළ සිදුවූයේ අවුරුදු තුනෙන් තුනට සේවක වැටුප් වැඩිකරන විට ඉතාම අඩු ප්‍රතිශතයකින් විශ්‍රාමිකයාගේ වැටුප් වැඩි කිරීමය. මේ නිසා රජයේ සේවකයින්ගේ වැටුප් තුළ දක්නට නොලැබෙන විශාල පරතරයක් මහ බැංකු විශ්‍රාම ලබන්නන් තුළ නිර්මාණය වී ඇත. 1978 විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපති වරයෙකු හා 2003 විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිවරයෙකු අද ලබාගන්නා විශ්‍රාම වැටුපේ පරතරය 427% කි. මීට ආසන්න කාලපරාසයක් ඇති විධායක අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකු අතර පරතරය 120% කි. තුන්වැනි ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු අතර පරතරය 180% කි. මාණ්ඩලික නොවන හතරවැනි ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු අතර පරතරය 208% කි. සුළු සේවක මහතුන් දෙදෙනෙකු අතර පරතරය 60% කි."

(සැදෑව - 2009 පෙබරවාරි)

මෙම පරතරය තවත් වැඩිවන ප්‍රවණතාවයක් මහ බැංකුව තුළ දැන් නිර්මාණය වන බව මට පෙනී ගොස් ඇත. එනම් අධිපතිතුමාගෙන් පහළ නිලධාරීන් සිට ක්‍රමයෙන් පහතට ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුපට බර පැටවෙන විශේෂ දීමනා ක්‍රමයක් ආරම්භ වීමය. අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් හේතූන් මත කෙරෙන මෙම දීමනා විශ්‍රාම වැටුප් ගණනයේ දී වැඩි විශ්‍රාම වැටුප් ප්‍රමාණයකට හිමිකම් ලබයි. එම නිසා ඔවුන් විශ්‍රාම ගිය පසුව වුවද අනෙකුත් විශ්‍රාමිකයන්ට 5% බැගින් වන වැටුප් වැඩිවීම් වලදී එතරම් අවාසියක් සිදුනොවේ.

එම නිසා මහ බැංකු විශ්‍රාම වැටුප් අරමුදලේ දුර්වලතාවය නිසා අඩු ප්‍රතිශතයකින් විශ්‍රාමිකයිනට වැටුප් වැඩිකල යුතුයැයි නිර්දේශ කරන නිලධාරීන් තම විශ්‍රාම වැටුපට මෙසේ බෙදා ගනිද්දී එයින් අරමුදලට වන හානිය නොතේරීම පුදුමයට කරුණකි. එබැවින් මහ බැංකු විශ්‍රාමිකයින්ගේ වැටුප් පිළිබඳ පූර්ණ සමාලෝචනයක් කළයුතු බවට ඔබ සංගමය දරන මතය නිවැරදි බව මගේ හැඟීමයි. නමුත් මෙම ප්‍රශ්නයේ දී 'මහසෝන්' පාර්ශවය දැඩි විරුද්ධත්වයක් පා ඇත.

"අපගේ ඔත්තුකරුවෙකුට මොහු (සභාපති) වරක් ප්‍රකාශ කර ඇත්තේ 1970 ගණන් වල සහ 1980 ගණන් වල විශ්‍රාම ගිය විධායක නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ඉතා පහත් මට්ටමක පවත්නා බවත් දැන් එම තත්ත්වයෙන් විශ්‍රාම යන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ඉතාමත් ඉහළ බවත් මෙම පරතරය නැති කිරීම ප්‍රථමයෙන් කළ යුතු බවය. ......................... මහතා සහ ......................... මහතා පැරණි ජ්‍යෙෂ්ඨ විශ්‍රාමිකයින් දෙදෙනෙකි. ......................... මිය සහ ......................... මිය අලුතෙන්ම විශ්‍රාම ගිය ඒ මට්ටමේ දෙදෙනෙකි. මේ දෙදෙනාගේ විශ්‍රාම වැටුප් පරතරය අඩු කිරීමට ......................... සහ ......................... ගේ විශ්‍රාම වැටුප් යටත් පිරිසෙයින් ලක්ෂයකින්වත් වැඩි කළ යුතුය. ඒ කිසිසේත් කළ නොහැක්කකි."

මහසෝනාගේ මෙම ප්‍රකාශය විශ්‍රාම වැටුප් අර්බුදයේ සැබෑ ස්වභාවය වසන් කිරීමට ගත් උත්සාහයකි. අවුරුදු තුනෙන් තුනට කීයක් හෝ වැඩි කර ගැනීම තුලින් මහ බැංකු විශ්‍රාමිකයින්ගේ ගැටළුවට නියම විසඳුමක් ලැබෙන්නේ නැත. මෙහි දී අනිවාර්යයෙන්ම රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දී ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාමිකයන්ගේ වැටුප් තල කලින් කලට යාවත්කාලීන කිරීමේ ක්‍රමය හඳුන්වා දිය යුතුව ඇත. බොහෝ කාලයක් ගතවී ඇති නිසා දැන් මෙය එක්වර සිදු කළ නොහැකිය. වසර තුනකට වරක් මතුවන වැටුප් වැඩිකර ගැනීමේ අවස්ථාවේ දී නොව ඒ අතරතුර කාලයේ දී විසඳිය යුතු ගැටළුවකි. මේ සඳහා පූර්ණ බලය ඇති කමිටුවක උපදේශයන් අවශ්‍ය වනු ඇත. ඒ සඳහා මහ බැංකු පාලන අධිකාරය මෙහෙයවීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි.

පසුගිය ජනාධිපතිවරණයේ දී මගේ මිත්‍ර විශ්‍රාමික රජයේ නිලධාරියෙකු සිය දුරකතනය

මගින් මිතුරන් අමතමින් මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටියේය. ඔහු මටද මෙම ඉල්ලීම කළත් මම ඔහු සමග එකඟ නොවීමි. හමුත් මේ නිසා ඔහුත් මාත් අතර දීර්ඝ දුරකතන සංවාදයක් ඇති විය. ඔහුගේ තර්කය වූයේ අද බොහෝ විශ්‍රාමිකයන් හොඳ විශ්‍රාම වැටුපක් ලබන්නේ මහින්ද රාජපක්ෂ මහතාගේ යම් යම් මැදිහත්වීම් මත බවය. අනෙකුත් පක්ෂ නායකයින්ට සාපේක්ෂව ඔහු මේ සඳහා බොහෝ කරුණු කාරණා ඉදිරිපත් කළේය. අකැමැත්තෙන් වුවද ඔහුගේ සමහර කරුණු ඉදිරිපත් කිරීම් හමුවේ බාධා කිරීම්වලින් තොරව ඔහුට සවන්දීමට සිදුවිය. ඔහු අවසාන වශයෙන් සඳහන් කළේ රාජපක්ෂ මහතා සාමාන්‍ය ජීවිතයේ දී දරුවන් සහ වැඩිමහල්ලන් කෙරෙහි සංවේදී වන චරිතයක් බවත් මැතිවරණ ව්‍යාපාරවලදී එය ඇතැම්විට අනවශ්‍ය ලෙස ඉස්මතුවන්නට කාරණා යෙදුණු බවත්ය. ඔහු තම අදහසට දයාන් ජයතිලක මහතාගේද ප්‍රකාශයක් උපුටා දක්වමින් කියා සිටියේ මහින්ද චින්තනය ගැන කතා කරන බොහෝ දෙනෙකුට එහි ආත්මීය හරය තේරුම් ගැනීමට ශක්තියක් නොමැති බවය.

කරුණු මෙසේ නම් මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමයට මෙම කලදසාව ලැබුවේ මහින්ද චින්තනය වෙනුවෙන් පෙනී සිටියත් එහි හරය වටහා නොගත් අය නිසාදැයි ප්‍රශ්න කිරීමට සිදුවනු ඇත.

සමස්තයක් වශයෙන් ගත්කළ මහ බැංකු විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නය තරමක් ව්‍යාකූල බවට පත්වීමේ ලකුණු පහළ වෙමින් පවතී. මෙහිදී මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ කාර්ය භාරය ඉතා වැදගත් වනු ඇත. වර්තමාන විධායක කමිටුව මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය දැනුමෙන් සන්නද්ධ වුවත් සටන සඳහා උපයෝගී කරගත් විධි සහ ක්‍රමෝපායන් ප්‍රාණවත් නැති බව කෙනෙකුට තර්ක කළ හැකිය. ඒ අනුව මීට වඩා සටන්කාමී නායකත්වයක් තිබිය යුතු බවට පොදු මතයක් ගොඩ නැගී තිබිය හැකිය. නමුත් මින් පෙරදී මෙවන් තත්ත්වයක් උද්ගත වූ විට සංගමයේ නායකත්වය දැඩි තීරණවලට ගියද ඒවා එතරම් ඵලදායිවූයේ නැත. ඉල්ලීම් දිනා ගැනීමට වැඩ කරන සේවක කොටස් කරනු ලබන මට්ටමේ බලපෑමක් විශ්‍රාමිකයිනට කළ නොහැකිය. නමුත් ඔබ කණ්ඩායමේ කාර්යභාරය අවසන් වී ඇති බැවින් ඔබ සැමට සමු ගැනීමට කාලය පැමිණ ඇතැයි මට සිතේ.

අවසාන වශයෙන් කිවයුතු දෙයක් ඇත. මම තාමත් මහ බැංකු විශ්‍රාමිකයෙකු වශයෙන් සෑහීමකට පත්වීමට ප්‍රයත්න දරමි. අඩුපාඩුකම් කෙතරම් තිබුණත් තවමත් මහ බැංකුව මට සාධාරණය ඉෂ්ඨ කරතියි සිතමි. නමුත් මහ බැංකුවේ සේවක කොටස් වර්තමානයේ භුක්ති විඳින බොහොමයක් වරප්‍රසාද අතීතයේ දී සටන් කොට දිනාගත් ජ්‍යේෂ්ඨයිනට නොසලකා හැරීම කණගාටුදායකය. එහෙත් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා යොදනු ලබන ක්‍රියාමාර්ග තුළින් අනවශ්‍ය ආන්දෝලන ඇති කිරීම පොදුවේ මහ බැංකු සේවකයන්ගේ වරප්‍රසාදවලට අහිතකර බලපෑම් එල්ල විය හැකි බැවින් මම ඒවාට නොකැමැත්තෙමි. එම නිසා ආවේගශීලී නොවීම අනාගතයේ දී වැදගත් විය හැකිය.

මට රට හැර යාමට සිදුවී ඇත්තේ පෞද්ගලික හේතුවක් නිසාය. එනම් වැළඳී ඇති රෝගී තත්ත්වයක් නිසාය. රෝගයෙන් මිදීමට පිටරට දී හැකිය යන දරුවන්ගේ මතයට ඉඩදීමට මට සිදුවී ඇත. මම මහ බැංකුව කෙරෙහි තවමත් ප්‍රසාද සිතින් සිටිමි. හිටපු අධිපති අමරානන්ද ජයවර්ධන මහතාගේ ප්‍රකාශයක කොටසකින් මම මගේ ලිපිය අවසන් කරමි.

"මහ බැංකුව වැනි ආදර්ශමත් හොඳ ප්‍රගමනයක් පිළිබිඹු කරන ආයතනයන් හැම විටම සේවයේ යෙදී සිටින සේවකයින් මෙන්ම දීර්ඝ කාලයක් සේවය කොට විශ්‍රාම ගිය සේවකයින් සහ ඔවුන්ගේ අඹුදරුවන්ද සලකනු ලබන්නේ එකම පවුලක සාමාජිකයන් ලෙසටය. මෙම දර්ශනයේ සාරය ආත්මීය වශයෙන් උකහාගන්නා යහපත් ආයතන ප්‍රබෝධාත්මක ප්‍රතිපත්ති තුළින් වර්තමාන සේවකයින් හා විශ්‍රාමිකයින් අතර නොබිඳෙනසුළු අන්තර් සබඳතාවයක් ගොඩනංවයි."

(සැඳෑව - 2009 පෙබරවාරි)

ඔබ සැමට ආයුබෝවන්.

මීට, හිතවත්,

මහ බැංකු විශ්‍රාමිකයෙක්

මෙම සැඳෑව පාඨකයාගේ ලිපිය කිසිදු වාරණයකින් තොරව පළ කළෙමි. ඔහුගේ අදහස් හා එකඟවීම කෙසේ වෙතත් ඔහුගේ ප්‍රකාශන නිදහසට සැඳෑව ගරු කරයි. එම නිසා මෙහි එන විවාදාත්මක අදහස් සංගමයේ අදහස් නොව, ලේඛකයාගේ පෞද්ගලික අදහස් බව කරුණාවෙන් සලකන්න.

- සංස්කාරක -

## පොතක් නිකුත්වෙයි

අප සංගමයේ සාමාජික **පී.ඩී. අබේපාල මහතා** විසින් රචනා කරන ලද **"පාලම"** නම් නවකථාව සියලුම සරසවි පොත් හල් වලින් ලබා ගත හැකි බව ඒ මහතා දන්වා ඇත. මීට අමතරව **"බොල් අස්වනු"**, **"විලක නෙළුම්"** යනුවෙන් තවත් ග්‍රන්ථ දෙකක් ද ඒ මහතා රචනා කර ඇත.

## සුරතල් පොඩි දුව දෝණි

ඉරා අඳුරු පට පෑයූ සුපුන් සඳයි දෝණි
ගනඳුරු ලොව නිවන සිහිල් පවන දෝණි
මිහිමඩලේ දුහෙ නිවන සිහිල් පවන දෝණි
වසන්තයේ පිණි තවරා පිපි කුසුමයි දෝණි

මදුර පරසතු කඩුපුල් සුවඳ හමන දෝණි
තුරුලිය මත මල් ගොමුවේ මල් රැජිනයි දෝණි
විසිතුරු සමනල් ලෝකෙක සැරි සරණා දෝණි
හිමාලයෙන් එපිට නැවුම් මිහිර ගෙනෙන දෝණි

පරණ සාරි කෑලි සොයා ඉන දවටන දෝණි
අම්මගෙ මිරිවැඩි පළඳ ගමනේ යන දෝණි
මල්ලි අතින් අල්ලාගෙන නෑගම් එන දෝණි
අම්මේ! අම්මේ! කියමින් නඩු ගොතනා දෝණි

පංතියෙ ගුරුතුමියක වී රඟ දක්වන දෝණි
එක-දෙක-තුන-හතර කියා හිස පද්දන දෝණි
"සද්ද නොකර වාඩිවෙන්න" අණකරනා දෝණි
නමෝ නමෝ මාතාවෙන් පංති අරින දෝණි

සෙල්ලම් ගේ කැඩුව මල්ලි හැංගුණු කල දෝණි
ගෙයි මුල්ලේ කඳුළු සලා සුසුම් හෙලන දෝණි
මල්ලි සොයා යළි සුරතල් සිනා නගන දෝණි
ගිනිගත් සඳ මඩල පවා සිසිල කරන දෝණි

ලේන් කුරුළු නාද සමග දොඩමළු වන දෝණි
මල් නැටුමෙන් පාලු නිවස රඟහල කළ දෝණි
සමන් මල් පියලි පාටින් කිරිදත් පා දෝණි
තුන් ලොව දුක් පලවා හැර සිනා නගන දෝණි

මාකොළ - ප්‍රේමා චන්ද්‍රසේන

## "සෝබන සැන්දෑවේ .......!"

මහ බැංකුවේ සිසිල මැද පැය අට ගෙවිනී
තිස් හතලිස් වසර ගතවුවා නොදැනී
මිතුරන් මිතුරියන් පිරිවර හද තුටිනී
සිටියා එකම පවුලක දරු කැලක් මෙනී

සුළු සිත් රිදුම් ආවත් අමතක කරලා
අප සැම අතර හිතවත් කම දලු දමලා
සුන්දර මතක ගොන්නක් හැමටම දීලා
නිහඬව කිමද? බැංකුව අද ඉවත බලා

අවුරුදු ගණන් සේවය කළ දෙටුවන්ට
දුටු විට නුදුටු ලෙස හොඳ නෑ ඔබ ඉන්ට
සේවය කරන මහතුනි! අද බැංකුවට
අත හිත නොදෙනු කිසිවිට සිත් රිදවන්ට

රන්වන් වලා පාවෙයි දුර අහස පුරා
දේදුනු කැලුම් දෝරේ යයි අතර තුරා
"දිදුලන මද්දහන" නොව සිත් සතන් පුරා
"සැන්දෑ යාමයයි" සුන්දර දිවිය පුරා

ගාමිණී චන්ද්‍රසේන විසිනි.

## නව සාමාජිකයෝ


| | |
|---|---|
| 464 | එන්. ද සිල්වා විජේනායක මිය |
| 466 | ආර්.ඒ. යසවතී මිය |
| 932 | අයි.එච්. වික්‍රමසිංහ මිය |
| 1058 | එච්.ඒ. පෙරේරා මයා |
| 1164 | ඒ.ඩී. ආරියරත්න ජයසිංහ |
| 1170 | ඩබ්.ඒ. විජේවර්ධන මයා |
| 1172 | ආර්.පී.පී. රත්නායක මයා |
| 1174 | ඩී.බී. සමරවික්‍රම මයා |
| 1175 | කේ.එල්. ද සිල්වා මයා |
| 1183 | එම්.ඒ. පියදාස මයා |
| 1184 | රෝස් හයසින්ත් මෙන්ඩිස් මිය |
| 3052 | එච්.ඩබ්. හබරගමුවගේ මයා |
| 3252 | පී. දමයන්ත මයා |
| 3338 | ඩබ්.ඩී.පී. රැළිගු මයා |
| 3347 | ඒ.ඒ.යූ. කමලසිරි මයා |

## අභාවප්‍රාප්තවීම්

| | |
|---|---|
| 576 | ජී.එල්. ප්‍රේමතිලක මයා |
| 200 | මාලි පීරිස් මිය |
| 574 | පද්මා වෙත්තසිංහ මිය |
| 3170 | එල්.ජේ.එම්. ගුණතිලක මයා |
| 3116 | ඩබ්. ලීලා ගුණවර්ධන මිය |
| 330 | එස්. නඩරාජා මයා |
| 228 | ටී.එම්.එම්. පීරිස් මයා |
| 607 | සින්තියා පීරිස් මිය |
| 651 | ඩී. විතාරණ මයා |
| 893 | ආර්.එම්.පී. රත්නායක මයා |
| 969 | සුදත් ජයසූරිය මයා |
| 680 | එච්.එම්. අබේරත්න මිය |

## <u>සුවදායී සති අන්ත චාරිකාවක් සඳහා ඔබට සුහද ආරාධනා</u>

ඔබ මෙතෙක් නොඉවසිල්ලෙන් බලා සිටි අපගේ පෙදින චාරිකාව ලබන මාර්තු මස 28 වැනි දින ආරම්භ කිරීමට සුදානම් කර ඇත. ඒ පොලොන්නරුව සහ නැගෙනහිර වෙරළේ පාසි කුඩා වෙත ගොස් සිරි නැරඹීම සඳහාය. සුඛෝපභෝගී බස් රථයක සාධාරණ අයකිරීමක් සමග ඔබගේ ප්‍රිය සහෘදයන් සමග උපරිම විනෝදාස්වාදයක් ලබා දීමට අදහස් කරමු. ගමන් මග මෙසේය.



<u>මාර්තු 28 වැනි දින</u>

පෙරවරු 6.30 කොළඹින් පිටත්වීම

(කරුණාකර ඔබගේ උදේ ආහාරය රැගෙන එන්න)

තේ පානය - කුරුණෑගල "සරු කෙත" ආපන ශාලාව

පොලොන්නරුව හෝටේල් "සිලෝන් ඉන්" වෙත ළඟාවීම සහ අඹන් ගඟ අසබඩ අංගමැඩිල්ලට පැමිණීම - රිසි නම් දිය නෑම සහ දිවා ආහාරය (ඔබේ නාන ඇඳුම් ගෙන ඒමට අමතක නොකරන්න)

සන්ධ්‍යා සමයේ ගල් විහාරය වෙත යාම

රාත්‍රී ආහාරය, සංගීත සාදය සහ විවේක ගැනීම



<u>මාර්තු 29 වැනි දින</u>

පෙ ව 5.30 උදෑසන තේ

පෙ ව 7.00 උදේ ආහාරය

පාසි කුඩා වෙරළ බලා පිටත්වීම

තේ පානය

ඔබේ සිතැඟි පරිදි විනෝදවීම - මුහුදේ නෑම - ගායනා නැටුම් - අවට ස්වාභාවික පරිසරය නැරඹීම

දිවා ආහාරය

සවස තේ

රාත්‍රී ආහාරයෙන් පසු හෝටලයේ නවාතැන් ගැනීම



<u>මාර්තු 30 වැනි දින</u>

පෙ ව 5.30 උදෑසන තේ

පෙ ව 7.00 උදේ ආහාරය

ආපසු පිටත්වීම

අතර මගදී දිවා ආහාරය (දිවා ආහාරය ඇසුරුම ද සමග)

ප ව 6.00 ට පමණ කොළඹට ළඟාවීම

මේ සඳහා ඔබට වැයවනුයේ රු. 4500/- කි. ඔබ මෙම චාරිකාවට සහභාගි වීමට රිසි නම් මෙම 'සැදෑවෙහි' පළකොට ඇති අදාළ ෆෝරමය සම්පූර්ණ කර මාර්තු මස 19 වැනි දිනට ප්‍රථම ඔබේ මුදල් සමග අප වෙත එවන්න. නවාතැන් හා ගමනාගමන පහසුකම් සීමිත බැවින් ඔබගේ වෙන්කර ගැනීම් අප වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කරනු ලැබේ.

**නියමිත වේලාවට ඔබේ වෙන් කරවා ගැනීම මගින් පසුතැවිලිවීම වලක්වා ගන්න.**

## මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය

370 /80, බෞද්ධාලෝක මාවත, කොළඹ 7
දුරකථනය : 2687797

2010 ජනවාරි 28 වැනි දින

ශ්‍රී ලංකා මහ බැංකු හිටපු අධිපතිවරයෙකු වන ආචාර්ය නෙවිල් කරුණාතිලක මහතාගේ අභාවය, අපගේ සිත් සතන් තුළ දනවන්නේ බලවත් සංවේගයකි. එතුමා ශ්‍රේෂ්ඨ මානව හිතවාදී ප්‍රාඥයකු විය. එතුමාගේ ඍජු භාවය නිසාම මහ බැංකුවේ "කීර්තිමත් මන්දිරය" තුළ එතුමාට හිමිවනුයේ අමරණීය ස්ථානයකි. බෞද්ධ දර්ශනය තුළින් ස්වකීය දාර්ශනික පැවැත්ම ඇතිකර ගෙන තිබූ අතර, ඒ බව එතුමාගේ චරිතය තුළින් මනා ලෙස පිළිබිඹු විය. එතුමා සිය ජීවිත කාලය තුළ රැස්කරගත් පුණ්‍ය සම්භාරය සසර ගමන කෙටි කර ගනිමින් නිර්වාණය සාක්ෂාත් කරගැනීමට හේතු වනු නොඅනුමානය.

ජීවත්ව සිටින්නවුන්ගේ සිත් සතන් තුළ ජීවත් වනවා යැයි කියනුයේ අමරණීය වීමය. යන කියමනක් තිබේ. ඒ කියමන අනුව ආචාර්ය නෙවිල් කරුණාතිලක මහතා අප සියල්ලන්ගේම සිත්සතන් තුළ සදාකාලිකව ජීවත්වනු ඇත. එතුමා සිය රාජකාරී කාලය තුළ අප වෙනුවෙන් කළා වූ යහපත් දේ අපි මහත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. එයින් විශේෂිත වනුයේ, මහ බැංකු සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට ඉමහත් යහපතක් සිදුකරන්නා වූ නුවරඑළිය, කතරගම හා අනුරාධපුර යන නගරවල නිවාඩු නිකේතන පිහිටුවීමයි. මෙම කර්තව්‍යය අප සැමගේ සුභ සිද්ධිය වෙනුවෙන් එතුමා තුළ තිබූ මානුෂික හැඟීම් පිළිබිඹු කරන අමරණීය සිහිවටනයකි.

තවද මහ බැංකුවට ත්‍රස්තවාදීන්ගෙන් තර්ජනයක් ඇති බව ඉවෙන් මෙන් දුටු එතුමා බාධක හා විරෝධතා මැඩ ගනිමින් මහ බැංකු පිවිසුම අබියස ශක්තිමත් බාධක දෙකක් ඉදි කළේය. එම යකඩ බාධක දෙක නොවන්නට එදා, 1996 ජනවාරි 31 දා, විශාල ජීවිත හානියක් මෙන්ම දේපල විනාශයක්ද සිදුවනු ඒකාන්තය. මෙම දූරදර්ශී සත්ක්‍රියාව පමණක්ම අප සියල්ලන්ගේ ආශිර්වාදය ඇතිව එතුමාට නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට හේතුවනවා ඇත.

විධායක කමිටුව.

## සාමාජිකත්වය නොසන්සුන්.

2009 විශ්‍රාම වැටුප් වැඩිකිරීම පිළිබඳව සාමාජිකත්වය බලවත් නොසන්සුන්තාවයකට පත්ව ඇත. මේ නිසා සාමාජිකයන් පිරිසක් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන ලෙස සංගමයෙන් ඉල්ලා තිබුණි.

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම අප්‍රේල් මාසයේ දී පැවැත්වෙන බැවින් ආසන්න මාස දෙකක් ඇතුළත රැස්වීම් දෙකකට සාමාජිකත්වය කැඳවීම ඔවුනට අපහසුවක් බැවින් අදාල කරුණු මහා සභා රැස්වීම තුළ බහුතර සාමාජිකත්වය ඉදිරියේ සාකච්ඡාවීම සුදුසුයැයි විධායක කමිටුව තීරණය කරන ලදී. වැටුප් ප්‍රශ්නයට අමතරව තවත් ප්‍රශ්න ද කිහිපයක් ගැන සාකච්ඡා කිරීමට අවශ්‍ය බව යථෝක්ත ලිපියෙහි සඳහන් වූ බැවින් එක් කරුණක් පමණක් සාකච්ඡා වන විශේෂ මහා සභා රැස්වීමකට වඩා සංවත්සර රැස්වීමකට මේ සියල්ල යොමු කිරීම කාලෝචිත වනු ඇත.

## උතුම් මිනිසෙකු පිළිබඳ සටහනක්

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙකු වූ ආචාර්ය පී.ඩබ්.ආර්.බී.ඒ.යූ. (උතුම්) හේරත් මහතා නොබෝදා අප අතරින් වෙන්විය. ඔහුගේ මළගමට පැමිණි අතිවිශාල ජනකාය ඔහු කෙතරම් සිත්ගත් චරිතයක් වී සිටියේ දැයි මැන ගැනීමට හොඳම සාක්ෂියක් විය.

1996 බෝම්බ ප්‍රහාරයෙන් මහ බැංකුව ඇද වැටුනු අවස්ථාවේ උතුම් හේරත් මහතා නිවසට වී දීර්ඝ නිවාඩුවක් ලබා ගත්තේ නැත. බෝම්බ ප්‍රහාරයෙන් පසුව ආයතනයට ඇතුල්වීමට අවසර දුන් පළමු දිනයේම ඔහු මහ බැංකු ගොඩනැගිල්ලේ පිටුපස පඩි පෙල දිගේ ලිපි ගොනු ඔසවා ගෙන යනු අපට දැකගත හැකිවිය. ඉස්පාසුවක් නොමැතිව වැඩ කරන්නට සිදුවීම ගැන තවත් සහෝදර නිළධාරියෙකු කරුණු විමසූ විට ඔහු නිහතමානීව කියා සිටියේ,

"මොනව උනත් අපි ජීවත් කරවන තැනනේ. අපි ඒකට ගරු කරන්න ඕන"

මෙවැනි උතුම් මිනිසුන් මහ බැංකුවට නැතිවීම දැරිය නොහැකි පාඩුවකි.

## විශ්‍රාමිකයන්ගේ ප්‍රාදේශීය සංවිධාන

ප්‍රාදේශීය වශයෙන් අප විශ්‍රාමිකයන් ඒක රාශි වී සංවිධාන කිහිපයක් පිහිටුවා ගෙන ඇති බව "සැඳෑවට" සැලවී ඇත. මෙම සංවිධානවල විශේෂත්වය වන්නේ නිරන්තරයෙන් රැස්වී ඔවුනොවුන් හමුවීමය. කැළණිය, මහර සහ බියගම ප්‍රදේශවල විශ්‍රාමිකයන් පිරිසක් "ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සුහද එකමුතුව" නමින් සංවිධානයක් පිහිටුවා ඇත. මාස දෙක හමාරකට වරක් සංගමයේ සාමාජිකයෙකුගේ නිවසෙහි රැස්වීම් පවත්වනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සුහද එකමුතුවේ ලිපිනය පහත දැක්වේ

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සුහද එකමුතුව

කැළණිය / මහර / බියගම

62/1 කටුකුරුන්ද වත්ත

මාවරමංඩිය

කඩවත

දුරකථනය : 011-2977865

## තවත් ප්‍රාදේශීය සංවිධානයක්

ශ්‍රී ලංකා මහ බැංකු ස්වේච්ඡා විශ්‍රාමිකයන්ගේ සුභ සාධක සංගමය නමින් තවත් සංවිධානයක් බිහිවී ඇත. සමාජ සුභ සාධනයේ යෙදීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වී ඇත.

2009 ඔක්තෝබර් මස 18 වැනි ඉරු දින මෙම සංගමය මගින් විශාල සමාජ මෙහෙවරක් සිදුකර ඇත. දිඹුලාගල කුඩාවැව ශ්‍රී බෙත්තාරාම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකරන ලද සංඝාවාසය සඟ සතුකොට පූජා කිරීම එම පුණ්‍ය කර්මයයි. මෙම පූජා කිරීම සිදුකරන ලද්දේ මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා අතිනි.

එම සංගමයේ ලිපිනය පහත පලවේ.

ශ්‍රී ලංකා මහ බැංකු ස්වේච්ඡා විශ්‍රාමිකයන්ගේ සුභ සාධක සංගමය

424 / 4A කෝට්ටේ පාර

පිටකෝට්ටේ

දුරකථන : 011-2636287

011-2960948

## සංස්කාරක සටහන

"සැඳෑව" තව නොබෝ දිනකින් නව විධායක කමිටුවේ භාරකාරත්වයට පත්වනු ඇත. පිට පිට වසර දෙකක් එකම විධායක කමිටුවක මඟපෙන්වීම යටතේ "සැඳෑව" නිකුත් විය. එම නිසා දැන් නව මුහුණුවරක් දීම කාලෝචිතය.

අප බලාපොරොත්තු වූ ආකාරයට "සැඳෑව" සාමාජිකත්වය අතර හොඳ සංවාදයකට මුල පුරා ඇත. "සැඳෑව" අප සාමාජිකයෝ ඉතා උනන්දුවෙන් කියවති. නමුත් "සැඳෑව" ට ලියන අය තවත් වැඩිවිය යුතුය. ඈත රටවල සිට ද "සැඳෑව" ට ලියන අය සිටිති. මේ කාලය තුළ කලාප නිකුත් වූයේ මාස තුන හතරකට වරකි. එය ප්‍රමාණවත් නොවන බව අපගේ හැඟීමයි.

කලාපයක් නිකුත් කිරීමට සංස්කාරක මණ්ඩලයට සෑහෙන පරිශ්‍රමයක් දැරීමට සිදුවෙයි. ඇත්ත ඇති සැටියෙන් පවසතොත් මහ බැංකුවේ කාරුණික අනුග්‍රහය නොලැබෙන්නට මෙවන් සඟරාවක් නිකුත් කිරීමට අපට හැකියාවක් නොමැත. මෙම අනුග්‍රහය දිගටම පවත්වා ගත යුතුව ඇත. අධිපතිතුමාගේ සිට රාජගිරිය මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලය දක්වා අපට ලැබුණු සහාය කරුණා පෙරදැරිව සිහිපත් කරමු.

සංස්කරණ කටයුතුවලදී විධායක කමිටුවට උදව් උපකාර කළ අය එමටය. මෙම "සැඳෑව" කලාපයේ පිටු සැකසීම ඉක්මනින් කර දුන් එම්.පී. සමන්ත මහතාටත් සෝදුපත් බැලීමේදී වෙහෙස මහන්සිය නොබලා සහාය දුන් පී.ඩබ්. ප්‍රනාන්දු මහතාටත් විජිත කරුණාරත්න මහතාටත් සංගමයේ විශේෂ ස්තුතිය හිමි වෙයි.

"සැඳෑව" තව තවත් ඔපවත් වී විශ්‍රාමිකයන්ගේ ආදරණීය සංහිවේදකයා බවට පත්වේවායි අවසාන වශයෙන් ප්‍රාර්ථනා කරමු.

"සැඳෑව" සඟරාවේ පළවන අදහස් ලිපි සම්පාදකයන්ගේ අදහස් මිස විශ්‍රාමිකයන්ගේ සංගමයේ නොවන බව කරුණාවෙන් සලකන්න.

පසු ගිය මහ සභා රැස්වීමේදී තීරණය කල පරිදි නැවත සකස් කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව ඔබේ දැන ගැනීම පිණිස පහත පල කරමු.

## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය
### 2008-12-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| වියදම | රු. | ශත | ආදායම | රු. | ශත |
|---|---|---|---|---|---|
| **සංගමයෙන් යෙදවූ සහනාධාර** | | | පොලී ලැබීම | | |
| වාර්ෂික මහා සභා රැස්වීම | 13702 | 00 | භාණ්ඩාගාර බිල්පත් | 99129 | 65 |
| එක්දින චාරිකාව කිතුල්ගල | 11242 | 50 | ස්ථාවර තැන්පත් | 91992 | 94 |
| **සංගමයේ ප්‍රදානයන්** | | | අත්පොත මුද්‍රණයට ලැබූ අනුග්‍රහය | 80000 | 00 |
| පරිත්‍යාගය ළමා නිවාසය (නායකකන්ද) | 37392 | 30 | විවිධ ආදායම් | 1066 | 40 |
| මරණාධාර | 52000 | 00 | දායකත්ව මරණාධාර අරමුදල | 6120 | 00 |
| දායකත්ව මරණාධාර අරමුදල | 6120 | 00 | | | |
| මල් වඩම් සඳහා ගෙවූ අත්තිකාරම් මුදල | 4900 | 00 | ආදායමට වැඩි වියදම | 74693 | 24 |
| කායඨාල ද්‍රව්‍ය | 1650 | 00 | | | |
| ලිපි ද්‍රව්‍ය | 7558 | 00 | | | |
| තැපැල් | 90266 | 00 | | | |
| යතුරු ලියන හා මුද්‍රණ | 35280 | 00 | | | |
| මුද්‍රණ අත්පොත | 66000 | 00 | | | |
| ගමන් වියදම් | 1500 | 00 | | | |
| බැංකු හරබදු | 581 | 43 | | | |
| වෙබ් අඩවිය සැකසීම | 15000 | 00 | | | |
| "සැඳෑව" ප්‍රකාශය | 7800 | 00 | | | |
| විවිධ වියදම් | 2010 | 00 | | | |
| | **353002** | **23** | | **353002** | **23** |

# ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඔබට පැසසුම්

"සැදෑව" 2009 අගෝස්තු කලාපයේ ඔබ සැමගේ පරිත්‍යාග මත ආරම්භ කළ රණවිරු අරමුදල ගරු ජනාධිපති තුමාට භාර දීමට තීරණය කර ඇති බව දන්වා සිටියෙමු. ඉන්පසුව ද අරමුදලට ආධාර ලැබුණි. ඒ අය ගේ නම් පහත පළ කරමු.

| | | |
|---|---|---|
| පද්මා ගුණසේකර මිය | රු | 5000 |
| බී.ඒ.එල්.කේ. පෙරේරා මයා | රු | 2000 |
| එස්.එම්. සමරක්කොඩි මයා | රු | 2000 |
| එස්.එම්. සමරක්කොඩි මිය | රු | 2000 |
| නන්දා ධර්මදාස මිය | රු | 2000 |
| අශෝක මාලිමගේ මිය | රු | 2000 |
| ඩබ්. සෝමසිරි මයා | රු | 1000 |
| ඩී.වී.ඩී. ජිනදාස මයා | රු | 1000 |
| ඩී. ජයසූරිය මිය | රු | 1000 |
| එම්.එච්. සවුජා මයා | රු | 1000 |
| එම්.ඒ. ජෝතිසේන මයා | රු | 1000 |

මහ බැංකු අධිපති තුමාගේ සහභාගිත්වය ඇතිව 2009-12-08 දින ගරු ජනාධිපති තුමාට රු. 435,000/= ක චෙක්පත භාරදෙන ලදී.

මින් පසුව ආරක්ෂක අමාත්‍යාංශයෙ 2010-01-06 දින මෙම අරමුදලට දායකවීම සම්බන්ධයෙන් විශේෂ ලිපියක් සංගමයට එවා ඇත. එය සාමාජිකත්වයට කෙරෙන පැසසුමක් බව අපගේ හැඟීමයි.

# CBPA 3 DAY TRIP TO POLONNARUWA & PASSIKUDAH

28th to 30th March 2010

**Hony. Treasurer G F L Perera, 77/2, Calvary Road, Ja-Ela**

Telephone 011 2235468

I enclose a Cheque/Money Order No. ........................ ...for Rs ..............

on behalf of ............. participants.

Name: ........................................... Pension/Widow/Widower No. ............

Telephone No. ...................

(Please send your cheque crossed in favour of "Central Bank Pensioners' Association" or a Money Order in favour of Mr **G F L Perera** to be cashed at **Ja-Ela Post Office**. Please ensure payment on or before **19th March 2010**).

I am / we are - Vegetarian / Non-vegetarian -

(*Please strike off whichever is inapplicable*).

---

**මහ බැංකු විශ්‍රාමික සංගමය - පොළොන්නරුව සහ පාසිකුඩා තෙදින චාරිකාව**

2010 මාර්තු 28-30

ගරු භාණ්ඩාගාරික ජී එෆ් එල් පෙරේරා - 77 / 2 - කල්වරි පාර -ජා ඇල

දුරකථනය : **011 2235468**

තෙදින චාරිකාව වෙනුවෙන් සහභාගි වන ............ කෙනෙකු වෙනුවෙන් අදාළ ගාස්තුව වශයෙන් රු.....................ක මුදලක් සඳහා චෙක් පතක් / මුදල් ඇණවුමක් මේ සමග එවමි .

නම ................................................ විශ්‍රාමික / වැන්දඹු / වැන්දඹුපුරුෂ අංකය ............

දුරකථන අංකය ............

මම / අපි නිර්මාංශ ආහාර ගන්නා / නොගන්නා අය වෙමු

ඔබගේ මුදල් චෙක්පතක් මගින් නම් - ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සංගමය නමින් රේඛනය කර එවන්න. මුදල් ඇණවුමක් නම් - ජී එෆ් එල් පෙරේරා මහතාගේ නමට ගෙවන කාර්යාලය - ජා ඇල තැපැල් කාර්යාලය ලෙස සඳහන් කර- 2010 මාර්තු මස 19 වැනි දිනට පෙර ඉහත ලිපිනයට එවන්න